**කන්තලේ ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කන්තලේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කන්තලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය

හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූලා‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූලා‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූලා‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූලා‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු මුද්දර ගාස්තුව රු.2,625,150 ක් වුවද ගිණුමේ එය රු.1,471,585 ක් ලෙස දක්වා තිබීම නිසා මුද්දර ගාස්තු මුදල රු.1,153,565 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂය දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.1,471,585.00 ක් වන අතර 2023 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු සොයාගත නොහැකි වීම හේතුවෙන් වැරදි ගිණුම්ගත කිරීම් සිදුව ඇති බව හා ඉදිරියේදී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | කාර්යාලයේ පරිපාලන ගොඩනැගිලි කාමර වෙන් කිරීම (Partition) වෙනුවෙන් වැය කරන ලද රු. 179,661 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | කාර්යාලයේ පරිපාලන ගොඩනැගිලි වෙන්කිරීමේ වටිනාකම 2024 අවසාන් ගිණුම් සකස් කිරීමේදී ගිණුම් වලට ගැනීමට කටයුතු කරන බව | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.171,411 ක ස්ථාවර තැන්පත් පොළිය ලැබිය යුතු ශේෂයන් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි. | ස්ථාවර තැන්පත් පොලී ආදායම් 2024 අවසන් ගිණුම් සකස් කිරීමේදී වැරදි නිවැරදි කර ගිණුම් වලට ගැනීමට කටයුතු කරන බව | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාදේශීය සභා අරමුදලට, ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියෙන් (LDSP) ලැබී තිබූ රු.28,797,053 ක් වූ අරමුදල් ප්‍රාග්ධන ලැබීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | LDSP අරමුදල් වල ප්‍රාග්ධන ලැබීම් හා ප්‍රාග්ධන වියදම් 2024 වර්ෂයේ සිට නිවැරදිව පොත් වලට ගෙන නිවැරදි ක්‍රමවේදයට අනුව සිදුකරගෙන යැමටත්, නිසිපරිදි ගිණුම් ගත කිරීමටත් කටයුතු කරන බව | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වර්ෂය තුළදී වැය කරන ලද රු.32,873,781 ක ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය (LDSP) මුදල් ප්‍රාග්ධන වැය ලෙස පෙන්වා නොතිබුණි. | LDSP අරමුදල් වල ප්‍රාග්ධන ලැබීම් හා ප්‍රාග්ධන වියදම් 2024 වර්ෂයේ සිට නිවැරදිව පොත් වලට ගෙන නිවැරදි ක්‍රමවේදයට අනුව සිදුකරගෙන යැමටත්, නිසිපරිදි ගිණුම් ගත කිරීමටත් කටයුතු කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඊ) | අධිගණනය වී ඇති තොග වටිනාකම රු.3,601,719 ක් ලෙස සමුච්චිත අරමුදලට ගැලපුම් කර තිබුණි. එසේ වුවද වසර 4 ක තොග ශේෂ විග්‍රහ කර බැලීමේදී එවැනි අධිගණනය වීමක් සිදු වී තිබූ බවට තොරතුරු විගණනයට වාර්තා නොවීය. | තොග ශේෂවල වැරදි හඳුනාගෙන නිවැරිදි වටිනාකම් ගණනය කර ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේ දී වරද නිවැරිදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි | 225,545,244 | ඉඩම් හා ගොඩනැගිලි උපලේඛන, හිමිකම් ඔප්පු හා බිම් සැලසුම් | උපලේඛන සකස් කිරීමට හා විෂයය පථයට අදාල ලේඛන සකස් කර යාවත්කාලීන කරන බව | ගිණුම් විෂයයන්ට අදාළ නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | යන්ත්‍ර උපකරණ | 27,885,507 | උපලේඛනය | - එම - | - එම - |
| (ඇ) | මෝටර් රථ හා කරත්ත | 51,040,044 | වත්කම් උපලේඛනය, ලියාපදිංචි සහතිකය | - එම - | - එම - |
| (ඈ) | ලී බඩු හා සවිකිරීම් | 8,144,054 | වත්කම් උපලේඛනය | - එම - | - එම - |
| (ඉ) | ආයුධ හා ආම්පන්න | 2,331,900 | වත්කම් උපලේඛනය | - එම - | - එම - |
| (ඊ) | පොදු ගබඩා | 530,246 | තොග උපලේඛනය | - එම - | - එම - |
| (උ) | ආයුර්වේද තොග ගබඩා | 253,994 | තොග උපලේඛනය | - එම - | - එම - |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඍ) | හිඟහිටි වෙනත් ආදායම් | 14,277,666 | කාල විශ්ලේෂණ, කේවල ශේෂ ලැයිස්තුව | - එම - | - එම - |
| (එ) | විවිධ ණය හිමියෝ | 4,129,651 | කේවල ශේෂ ලැයිස්තුව, කාල විශ්ලේෂණය | - එම - | - එම - |
| (ඒ) | හිඟහිටි කඩකුලී | 6,479,861 | කාල විශ්ලේෂණය | - එම - | - එම - |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති. රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | | |
| (i) | 24 වගන්තිය | සභාව සතු මාර්ග හඳුනාගෙන ඒවා ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 134 වගන්තිය | බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු ප්‍රදේශ කලින් කලට හඳුනාගෙන වරිපනම් බදු අයකළ යුතු වුවද 1980 වර්ෂයට පෙර හඳුනාගත් ප්‍රදේශ සඳහා පමණක් වරිපනම් බදු අයකිරීමට කටයුතු කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | - එම - |
| (iii) | 135 වගන්තිය | බල ප්‍රදේශය තුළ පිහිටි වරිපනම් බදු නිදහස් කළ යුතු පොදු, ආගමික පුණ්‍ය කටයුතු, අධ්‍යාපනික හා ගෘහ නිදහස් දේපළ ලැයිස්තුවක් සකස් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | (iv) 139 වගන්තිය | වරිපනම් බදු පැනවීමට යටත් යම් ගෙයක් ගොඩනැගිල්ලක් ඉඩමක් හෝ දේපලක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට හැකිවනු පිණිස වාර වාර්තා කැඳවා නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය. |
| | (v) 152 වගන්තිය | තම බල ප්‍රදේශය තුළ පිහිටි බැංකු, මූල්‍ය සමාගම්, උකස් ව්‍යාපාර හා නීති උපදේශන වැනි වෘත්තීන් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | - එම - |
| | (vi) 158,159,162, 163 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.131,941,166 ක වරිපනම් බදු හා රු.25,612,621 ක හිඟ වරිපනම් බදු ආදායම් අයකර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | - එම - |
| (vi) | 126 (උ) ඡේදය | බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වාහන නැවතුම්පළවල් හා ත්‍රීවිල් නැවතුම් පළවල් මනාව කළමනාකරණය කොට නියාමනය කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | 1989 අප්‍රේල් 17 දිනැති අංක 554/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාව | | | |
| | (i) 32 වැනි රීතිය | සභාව විසින් ප්‍රාදේශීය පනත 23 ආකෘතිය ප්‍රකාරව වරිපනම් ලේඛන නඩත්තු නොකරන අතර MS Excel මෘදුකාංග | පිළිතුරු ලබා දී නොමැත. | ප්‍රාදේශීය සභා මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිටපතක් මගින් පමණක් තොරතුරු පවත්වාගෙන යාම හේතුවෙන් නිවැරදිභාවය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය. | | |
| (ii) 33, 34, 35 වැනි රීතිය | හිඟ වරිපනම් බදු අදාළ දේපළ අත්පත් කර ගැනීමට හෝ තහනම් කිරීමට පියවර ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් බල ප්‍රදේශයේ වරිපනම් කොට්ඨාශ 24 ක තුළ රු.5,000ට වැඩි හිඟහිටි දේපළ 883 ක සංඛ්‍යාවක් පැවැති අතර එම දේපළ වෙනුවෙන් රු.10,727,240 ක් අයවිය යුතු විය. ඒ සම්බන්ධයෙන් රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | - එම - |
| (iii) 53 වැනි රීතිය | සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියළුම ආදායම් ප්‍රභවයන් සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර වාර්තා සකස් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ප්‍රාදේශීය සභා මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) 59 වැනි රීතිය | සෑම වර්ෂයක් ආරම්භයේදී සභා බල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳව සමීක්ෂණයක් සිදු කර වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | - එම - |
| (v) 193 වැනි රීතිය | අයවැය හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයන්හි සත්‍ය වියදම් සසඳා අතිරික්තය හා ඌණතාවය පිළිබඳ හේතු | පිළිතුරු ලබා දී නොමැත. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | දැක්වෙන ප්‍රකාශයන් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | | |
| | (vi) 218 වැනි රීතිය | පිරිවැය රු.225,545,244 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | - එම - |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | | |
| | (i) මුදල් රෙගුලාසි 571 | වසර 02 ඉක්මවූ තැන්පත් (රැඳවුම් තැන්පත් 259) ශේෂ 05 ක් තැන්පත් ගිණුමේ රඳවා තබාගෙන තිබුණු අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 880 | ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු ඇප තැබිය යුතු හා නිලධාරීන්/ සේවකයින් 20 දෙනෙකුගෙන් නියමිත පරිදි ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 04/1994 හා 1994 පෙබරවාරි 18 දිනැති චක්‍රලේඛය | සෑම මාණ්ඩලික නිලධාරියෙකු විසින් වාර්ෂිකව තම වත්කම් හා බැරකම් ප්‍රකාශ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2008 පෙබරවාරි 25 දිනැති අංක 1533/16 දරණ ගැසට් පත්‍රය | ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර වලංගුවන දිනට මාස 03 කට ප්‍රථමයෙන් එම පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීමට කටයුතු කළ යුතු වුවද එවැනි කල් ඉකුත් වූ පරිසර ආරක්ෂණ බලපත්‍ර 19 ක් සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (උ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 02/2018 චක්‍රලේඛය | සෑම වර්ෂයකටම කාර්යසාධන ගිවිසුම්වලට එළඹිය යුතු බව දක්වා තිබුණද 2023 වර්ෂය සඳහා සභාව විසින් කාර්යසාධන ගිවිසුම් සකස් කර තිබුණද එම ගිවිසුම්වල ඇගයුම්ලාභියා, ඇගයුම්කරු හා ප්‍රමාණකරු විසින් අත්සන් තබා ගිවිසුමේ වලංගුභාවය ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,849,582 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.51,602,610 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 7,752 | 3,151 | 1,547 | 14,278 | 4,647 | 3,367 | 2,352 | 12,674 |
| කුලී | 28,589 | 5,946 | 4,205 | 6,480 | 12,625 | 6,931 | 5,173 | 4,739 |
| වෙනත් ආදායම් | 475 | 2,259 | - | 8,205 | 1,900 | 4,900 | 4,900 | 5,946 |
| **එකතුව** | **36,816** | **11,356** | **5,752** | **28,963** | **19,172** | **15,198** | **12,425** | **23,359** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය අවසානයට කඩකාමර 23 කින් අයවිය යුතු හිඟ කඩ කුලිය රු.2,824,194 ක් වූ අතර එයින් රු.1,691,962 ක මුදලක් වසර දෙකට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | පිළිතුරු ලබා දී නොමැත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | i. වරිපනම් බදු ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ තුළ තක්සේරු නොවූ දේපළ පිළිබඳ ලැයිස්තුවක් ආදායම් පරීක්ෂක විසින් සකස් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | තක්සේරු නොවූ දේපළ පිළිබඳ ලැයිස්තු සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ii. සභා බලප්‍රදේශය තුළ පිහිටි රජයේ දෙපාර්තමේන්තුවලට අයත් දේපළ වෙනුවෙන් අයවිය යුතු එකතුව රු.1,053,290 ක් වටිනා වරිපනම් අයනොවී පැවතුණි. | පිළිතුරු ලබා දී නොමැත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන්හි ඉටු කිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනි විටත් කාරණා 05 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | විධිමත් පරිදි අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. |
| (ආ) ප්‍රාදේශීය සභා කාර්යයන් අතර ප්‍රධාන කාර්යයක් ලෙසට බල ප්‍රදේශයේ සිදු කරන ඉඩම් සංවර්ධන කටයුතු නියාමනය කිරීම සිදු කළ යුතු වුවද 2021, 2022 හා 2023 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් සංවර්ධන බලපත්‍ර 11 ක් , 05 ක් හා 04 ක් බැගින් නිකුත් කර තිබුණි. එසේ වුවද බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් කිසිවක් වාර්තා නොවී තිබීම නිසා මෙම කාර්යයන් යහපත් අයුරින් නියාමනය වී නොතිබුණු බව තහවුරු විය. | පිළිතුරු ලබා දී නොමැත. | ඉඩම් සංවර්ධන කටයුතු නියාමනය කළ යුතුය. |
| (ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාසිකව එකතු කරන ලද ටොන් 150 ක් පමණ වෙන් නොකළ කසල තොග සූරියපුර කසල අංගනයට අවිධිමත්ව බැහැර කරනු ලබයි. ඒ හේතුවෙන් ප්‍රදේශය පුරා පොලිතීන් හා වෙනත් නොදිරන කසල විසිරී පැවැති බව නිරීක්ෂණය විය. මෙම කසල අංගනය වල් අලි ගමන් කරන | පිළිතුරු ලබා දී නොමැත. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

මාර්ගය අවහිර කොට ස්ථාපනය කර තිබූ බැවින් වල් අලින්ගෙන් සිදු වන හානිය දිගින් දිගටම වැඩි වී ඇති බැවින් කසල කළමනාකරණය මනාව සැලසුම් කිරීමේ අවශ්‍යතාවය පැවතුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තැන්පත් ලේඛන නිසි පරිදි පවත්වා නොතිබීම, ශේෂයන් පැන්සලෙන් සටහන් කර තිබීම හා තැන්පත් සිදු කළ දිනය නිවැරදිව සටහන් නොකිරීම යන කරුණු හේතුවෙන් වර්ෂ අවසානයට පැවැති රු.1,298,870 තැන්පත් ශේෂ 122 ක් සත්‍යාපනය කිරීමට නොහැකි විය. | පිළිතුරු ලබා දී නොමැත. | ව්‍යාපෘති අධීක්ෂණය හා සැලැසුම් කිරීම මනාව සිදු කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාවේ අනුමත සේවක මණ්ඩලය හා තථ්‍ය සේවක සංඛ්‍යාව සලකා බැලීමේදී තනතුරු 14 ක පුරප්පාඩු 27 ක් පවතින බව අනාවරණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් අමුණුම 02 ආකෘතිය පදනම් කර ගනිමින් සභාව විසින් මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් කළමනාකරණ සැලැස්මක් සකස් කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර තිබුණ අතර ප්‍රවර්ථන වර්ෂයේදී අභ්‍යන්තර විගණන වැඩසටහන් හඳුන්වා දී නොතිබුණි. එසේම අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කොට ජාතික විගණන කාර්යාලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අභ්‍යන්තර විගණනය විධිමත් කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 13 ක සිට සියයට 1389 ක් දක්වාද වියදම් විෂයන් 06 ක සියයට 26 ක සිට සියයට 85 ක් දක්වාද විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අයවැය තාත්ත්විකව පිළියෙල කළ යුතුය. |

### 4.3 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 අංක 47 දරණ ජාතික පරිසර පනතට සිදු කළ සංශෝධන ප්‍රකාරව කටයුතු නොකිරීමත් එකතු කරන කැලි කසල වර්ගීකරණයකින් තොරව මුදාහැරීම අක්‍රමවත් බැහැර කිරීම එම බැහැර ලන ද්‍රව්‍ය වන සතුන් විසින් පාරිභෝජනය කිරීම විධිමත් වැඩපිළිවෙලකින් තොරව කසල බැහැර කිරීම නිසා ඒ අනුව පරිසරය පොලිතීන්වලින් ගහනව පැවතීම හා මහවැලි කලාපයට අයත් ප්‍රදේශයක් නිසා ජල ගැලීම් කාලවලදී මෙම ද්‍රව්‍ය ජලයට එකතු වීම යන ගැටළු නිසා අවට ජීවත් වන මිනිසුන්ට මෙන්ම අලි ඇතුන් වැනි වන සතුන්ටද පාරිසරික ගැටළුවලට මුහුණ දීමට සිදු වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | කසල කළමනාකරණය මනාව සිදු කළ යුතුය. |